දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"For a prosperous future"

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/07/DCC/වාර්තා/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2024.06. 20

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - *2024.06.11*</u>

*2024.06.11* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03.ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 14 ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail .com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

එච්.පී.සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

එච්. පී. සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

පිටපත්:-

01 දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02 හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමල් රාජපක්ෂ මැතිතුමා - කරු.දැ.ගැ.ස.
03.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

| | | | |
|---|---|---|---|
| District Secretary — 047 2256235 | Additional District Secretary (Admin) — 047 2256232 | Additional District Secretary (Land) — 047 2256002 | Chief Accountant — 047 2256246 |
| Director (Agriculture) — 047 3628890 | Director (Planning) — 047 2256234 | Assistant District Secretary — 047 2256945 | Administrative Officer — 047 2256285 |
| Office | Fax — 047 2256235, 047 2256247 | email : moha.dist.hambantota@gmail.com; Web site : www.hambantota.dist.gov.lk | |

CamScanner

## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2024.06.11

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2024.06.11 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ දකුණු පළාත් සභාවේ අභිනව ආණ්ඩුකාරතුමන් සහ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සම සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

පසුගිය වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | වලස්මුල්ල මාපිටි කන්ද ෆයිනස් වගාව ඉවත් කර විකල්ප වන වගාවක් ස්ථාපිත කිරීම. | දැව ප්‍රවාහනය සඳහා යොදා ගන්නා මාර්ගය අබලන් තත්ත්වයේ පවතින බැවින් මාර්ගය භාවිත කිරීමෙන් පසු අවශ්‍ය අලුත්වැඩියාවන් කර දෙන ලෙසත්, ඒ සඳහා රු.ලක්ෂ 15 ක දල ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බවත් ඊට අවශ්‍ය එකඟතාවය දැව සංස්ථාවෙන් මෙ වන විටත් ලැබී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.<br>මෙම ඇස්තමේන්තු සහිත ඉල්ලීම දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට දන්වා ඇති බැවින් මෙම සතියතුළ පිළිතුරක් ලබා දිය හැකි බව දන්වන ලදී. | දැව සංස්ථාවේ එකඟතාවය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස දන්වන ලදී.<br>ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යොදා ගනිමින් මාර්ගය සකස් කර දෙන ලෙසත්, එහිදී මූල්‍යමය ප්‍රතිපාදනවල හිඟයක් පවතින්නේ නම් එය පළාත් සභාවෙන් ලබා දීමට ද ආණ්ඩුකාරවර තීරණය කරන ලදී. | නි.ප්‍රාදේශීය කළමනාකරු රාජ්‍ය දැව සංස්ථාව<br>ලේකම් ප්‍රාදේශීය සභාව කටුවන<br>දිසාවන නිලධාරී |
| 02 | සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරිම. | | | |
| | ➢ විමධ්‍යගත අයවැය වැඩසටහන | දිස්ත්‍රික්කය වෙනුවෙන් වෙන් කර ඇති රු.මිලියන 402 ට අදාළව සියළුම ව්‍යාපෘති ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ප්‍රතිපාදන ලබා දී ඇති බව දන්වන ලදී. එමෙන්ම ව්‍යාපෘති සංශෝධනය සඳහා ලබා දී තිබූ කාලය මැයි මස 31 දින දක්වා දීර්ඝ වූ බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉදිරිපත් කර තිබූ සංශෝධන අනුමැතිය සඳහා අමාත්‍යංශයට යොමු කර ඇති බවත් ඒවා ලැබුණු පසු අදාළ කාර්යාලවලට ලබා දීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කළ අතර, සුහුරු පන්ති කාමර සඳහා smart board සඳහා කැඳවා ඇති මිල ගණන් 2024.06.12 දින විවෘත කරන බවත් ඒ අනුව එම කටයුතු කඩිනමින් අවසන් කළ හැකි බවත් දන්වන ලදී.<br>විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රගතිය සලකා බැලීමේදී ඉදිකිරීම් ව්‍යාපෘති 417 ක් අතුරින් ව්‍යාපෘති 8 කම වැඩ අවසන් කර ඇති බවත් මිලදී ගැනීම් ව්‍යාපෘති 490 කින් ව්‍යාපෘති 310ක් | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට වෙන් කළ මුදල් සීමාවේ අවමය රු.මි.30 ක් වන ලෙස සංශෝධනය කිරීමට කමිටුවේ අනුමැතිය ලබා දුන් අතර සියළුම පාර්ශව එක්වී නියමිත දිනට ව්‍යාපෘති අවසන් කර ගැනීමට කටයුතු කළයුතු බව ද අවශ්‍ය අවස්ථාවලදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් චක්‍රලේඛ උපදෙස් මත පවරාදී ක්‍රියාත්මක කිරීමට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>දිස්ත්‍රික් අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>සාමාන්‍යාධිකාරී දකුණු පළාත්මාර්ග සං.අධිකාරිය<br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ගිණුම් අංශය වෙත යොමු කර ඇති බවත් මින් ව්‍යාපෘති 60 ක පමණ වැඩ අවසන් කර ඇති බවවත් කරුණු ඉදිරිපත් විය.<br>තවද, 2024.02.02 පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණය පරිදි විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ලැබී ඇති ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර රු.මිලියන 33.5ක් වන ලෙස සමසේ බෙදා වෙන් කළ අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පවතින විෂමතා හා ප්‍රජාවගේ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වෙන් වන ප්‍රතිපාදන අවමය රු.මිලියන 30 ක් වන ලෙස කාර්යාල අතර ප්‍රතිපාදන මාරුකර ගැනීම සඳහා සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කළ බවද, ඒ සඳහා කමිටු අනුමැතිය අවශ්‍ය වන බවද දන්වන ලදී. | | |
| | ➢ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | මෙම වැඩසටහන යටතේ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ව්‍යාපෘති 62 ක් ලැබී ඇති බවත් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයට ඇස්තමේන්තු යොමු කළ යුතු බවත් ප්‍රකාශ වූ අතර දැනට වලස්මුල්ල කාර්යාලයෙන් පමණක් ඇස්තමේන්තු 02ක් සකස් කර ඇති බවත් එම ව්‍යාපෘතීන්ද ඉංජිනේරු අනුමැතිය නොමැතිව අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බවත් දැනුම් දෙන ලදී. ඇස්තමේන්තු සකස් කිරීමේදී ඉංජිනේරුවරුන්ගේ නිර්දේශ නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘති ඉදිරියට කර ගෙන යාම ගැටලුවක් බවද දැනුම් දෙන ලදී. ඇස්තමේන්තු සකස් කිරීම සඳහා විශ්‍රාමික තාක්ෂණ නිලධාරීන් කොන්ත්‍රාත් පදනම යටතේ මාස 05 ක කාලයකට බඳවා ගැනීමේ හැකියාව පළාත් සභාවට පවතින බවට කරුණු ඉදිරිපත් විය. එහෙත් මෙම වැඩසටහන යටතේ ඉදිරිපත් වන ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී තාක්ෂණික නිලධාරීන්ට ඇස්තමේන්තු සකස් කළ හැකි සීමාව ඉක්මවා ඇති බැවින් ඇස්තමේන්තු අනුමත කර ගැනීම ගැටලුවක් බැවින් මෙම ව්‍යාපෘති කඩිනම් කර ගැනීම සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සහාය ලබා ගැනීම සුදුසු බවට අදහස් ඉදිරිපත් විය. | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුයුක්ත ඉංජිනේරුවරයකු මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කර ගැනීම සඳහා තාවකාලිකව අනුයුක්ත කර ගැනීම හෝ මෙම ව්‍යාපෘති යෝජනා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත චක්‍රලේඛ උපදෙස් පරිදි 3% පරිපාලන වියදම යටතේ පවරාදී ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු කල යුතු බවට තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>දිස්ත්‍රික් අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)<br>සාමාන්‍යාධිකාරී දකුණු පළාත්මාර්ග සං.අධිකාරිය<br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/<br>දිස්ත්‍රික් ඉංජිනේරු දකුණු පළාත්මාර්ග සං.අධිකාරිය |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1 | තිස්සමහාරාම ගහෝයාය මාර්ගය පිළිසකර කිරීම සම්බන්ධව | පසුගිය වැසි සමයේ ඇති වූ ආපදා තත්ත්වය හේතුවෙන් ගමනාගමනයට අපහසු තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් මෙම මාර්ගය සඳහා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තුවක් සකස් කර ඇති බවත් ඇස්තමේන්තු VAT මුදල සමඟ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 10.2 වන බවත් ඒ සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 යටතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති චමල් රාජපක්ෂ මැතිතුමා විසින් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙත වෙන් කර ඇති රු.මිලියන 07 ක් පමණ මුදලක් මෙ සඳහා වෙන් කර ඇති බවත් ඉතිරි මුදල සපයා ගැනීම ගැටළුවක් බවත් දන්වන ලදී.<br>ප්‍රදේශයේ මහජනතාවගේ ගමනාගමන පහසුව සඳහා මෙම මාර්ගය ඉතා අත්‍යවශ්‍ය බැවින් සහ මෙම මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක්ද වන බැවින් ඉතිරි මුදල ප්‍රාදේශීය සභාවෙන් ලබා ගැනීමේ හැකියාවක් පවතින බව දැනුම් දෙන ලදී. | විමධ්‍යගත අරමුදලෙන් ලබා දී ඇති රු.මිලියන 07ට අමතරව අවශ්‍ය ඉතිරි මුදල් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවෙන් ලබා ගෙන කඩිනමින් මාර්ගය සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ඉංජිනේරු දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව - තිස්සමහාරාම |
| 03 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීම | | | |
| 3.1 | සෑම පෙර පාසල් දරුවෙක්ම ජීවන කුසලතාවලින් පිරි දරුවකුලෙස නිර්මාණය කිරීම | සෑම පෙර පාසල් දරුවෙක්ම ජීවන කුසලතාවලින් පිරි දරුවකුලෙස නිර්මාණය කිරීමේ අරමුණින් සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශ විසින් මාර්ගෝපදේශයක් නිකුත්කර ඇත. එමගින් දිවයිනේ සෑම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශයකම ඇති පෙර පාසල්, සෞඛ්‍ය ප්‍රවර්ධන පෙර පාසල් බවට පත් කරන ලෙස දන්වා ඇති බවත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලියාපදිංචි පෙර පාසල් 603ක් ඇති බැවින් මෙම වර්ෂයේ පෙර පාසල් 60 ක් සෞඛ්‍ය ප්‍රවර්ධන පෙර පාසල් බවට පත් කිරීමට අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් කරන ලදී. එසේම මේ වන විට පෙර පාසල් 05ක් සඳහා පුහුණුවීම් ලබා දී ඇති බවත් කමිටු පත් කර ගැනීම සඳහා සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | කමිටු පත්කර ගැනීමේදී මව සංගම්වල සහයෝගය ලබා ගන්නා ලෙසත්, මෙම කටයුතු කඩිනම් කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ සහයෝගය ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ/<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස් හම්බන්තොට<br><br>පූර්ව ළමාවිය සංවර්ධන නිලධාරී<br><br>ළමා හිමිකම් නිලධාරී<br><br>පරිවාස හා ළමාරක්ෂණ නිලධාරී<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී |
| 3.2 | ප්‍රදේශයේ සුනඛ ගහණය වැඩිවීම සම්බන්ධයෙන් | ප්‍රදේශයේ සුනඛ ගහණය වැඩිවී ඇති බැවින් බෝවීම අඩු කිරීම සඳහා | අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා දීමට තීරණය | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | පැමිණිලි ලැබීම | වන්ධ්‍යාකරණ (LRT) සැත්කම සිදුකළ යුතු බවට කරුණු ඉදිරිපත් කරන ලදී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ වන්ධ්‍යාකරණ සැත්කම් 30,000 ක් පමණ කලයුතු බවත්, එක් සැත්කමක් සඳහා රු.3000.00 ක පමණ මුදලක් වැයවෙන බවත් ඒ සඳහා ලැබී ඇති ප්‍රතිපාදන අවශ්‍ය සැත්කම් සිදු කිරීමට ප්‍රමාණවත් නොවන බවත් පෙන්වා දෙන ලදී. | කරන ලදී. | |
| 3.3 | මී උණ සහ ඩෙංගු රෝගය පැතිරීමේ ප්‍රවනතාව සම්බන්ධව | දිස්ත්‍රික්කයේ මී උණ මරණ 07ක් සිදුවී ඇති බවත් ඉන් මරණ 02ක් පමණක් කුඹුරු ගොවිතැන් කටයුතුවල නිරත වූවන් විමත්, අනෙක් මරණ අතරින් කුරුඳු වගාවේ නිරතවූවන් සඳහා වැඩි ප්‍රවනතාවක් යොමුවී ඇති බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා දැනුවත් කිරීම සිදු කරන ලෙස ඉල්ලීම් කරන ලදී.<br>දිස්ත්‍රික්කයේ ඩෙංගු අවදානම අඩු වී ඇති බව ප්‍රකාශ කරන ලදී. මෙම තත්ත්වය දිගින් දිගටම පවත්වා ගැනීම සඳහා තවදුරටත් ග්‍රාමීය කමිටු සක්‍රියව තබා ගැනීමටත්, රාජ්‍ය ආයතනවල සිකුරාදා දින පැය 1/2 පමණ කාලයක් පිරිසිදු කිරීම් කටයුතු සිදු කරන ලෙසත්, නිවෙස් පිරිසිදු කිරීම ඒ අයුරින්ම සිදු කර ගතයුතු බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | සියළුම වගකිවයුතු පාර්ශව එක්ව් මහජනතාව දැනුවත් කිරීමේ ක්‍රමවේද වැඩි කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>ජේෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල<br><br>සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වරය |
| 3.4 | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලවල පවතින පුරප්පාඩු සම්බන්ධව | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහා කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරී, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් මෙන්ම ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල මට්ටමින් ද නිලධාරී පුරප්පාඩු පවතින බැවින් සාමාන්‍ය රාජකාරි ඉටුකර ගැනීම පවා ගැටළුවක් වී ඇති බව දන්වන ලදී.<br>ගුරුපත්වීම් නොලබා පළාත් සභා පාසල්වල සේවය කරන සංවර්ධන නිලධාරීන් ඉදිරියේදී දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයෙන් නිදහස් කිරීමේ හැකියාවක් පවතින බැවින් ඔවුන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල සඳහා සහ අවශ්‍යතා පවතින ආයතන වෙත අනුයුක්ත කල හැකි බව දන්වන ලදී. | සංවර්ධන නිලධාරී අවශ්‍යතාවයන් පවති නම් කඩිනමින් පළාත් සභාව වෙත දන්වන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ලේකම් දකුණු පළාත<br><br>ලේකම් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශය<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන් |
| 04 | අඟුණුකොළපැලැස්ස දිසා රෝහල පිහිටි ඉඩම සම්බන්ධව | අඟුණුකොළපැලැස්ස දිසා රෝහල පිහිටි භූමිය තුළ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගනිමින් පුද්ගලයින් 7ක් විසින් අනවසර කඩ ඉදිකර තිබීම ගැටළුවක්ව තිබූ බවත් | ඉදිරියේදී ගැටලු ඇති නොවන ලෙස කටයුතු කිරීම සඳහා කඩහිමියන්හට බස් නැවතුම්පොළ පිහිටි ස්ථානයේ ඉඩපහසුකම් ලබාදී රෝහල් භූමියේ ඉඩම සම්පූර්ණයෙන් | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>නේවාසික ව්‍යාපෘති |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | දැනට මහවැලි අධිකාරිය, රෝහල් කාර්ය මණ්ඩලය සහ කඩහිමියන්ගේ එකඟත්වයෙන් රෝහල් භූමිය වෙන්කරමින් වැටක් ඉදිකර ගැටලුව විසදා ගත් බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | වෙන් කර සිතියම සකස් කර සෞඛ්‍ය අමාත්‍යංශයට භාර දීම සුදුසු බවට උපදෙස් දෙන ලදී. | කළමනාකරු මහවැලි<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව<br>අගුණුකොළපැලැස්ස |
| 05 | පවතින වැසි තත්ත්වයත් සමඟ දිස්ත්‍රික්කය තුළ ඇතිවිය හැකි ආපදා අවදානම අවමකර ගැනීම සම්බන්ධව | නිරිතදිග මෝසම් තත්ත්වය මගින් ඇතිවිය හැකි බලපෑම අවමකර ගැනීම සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඇතුළු සියළු පාර්ශව එක්කර ගනිමින් ඇතිවිය හැකි සෞඛ්‍ය ගැටලු, කානු පද්ධති පිරිසිදු කිරීම කටයුතු සහ අවදානම් ගස් ඉවත් කිරීම සම්බන්ධව මෝසම් තත්ත්වය ඇති වීමට පෙර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කළ බව ප්‍රකාශ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෝසම් තත්ත්වය සමඟ ගංවතුරින් විය හැකි බලපෑම් අවම කර ගැනීම සඳහා ගංවතුර බැසයාම සඳහා කානු පිරිසිදු කිරීම,ගංගා මෝය කැපීම වැනි කටයුතු කඩිනමින් කළ බවත් මේ සඳහා ආරක්ෂක අංශ ඇතුළු රාජ්‍ය නිලධාරීන් එක්ව කටයුතු කළබව දැනුම් දෙන ලදී. එමෙන්ම ජල ගැලීම් තත්ත්වයන් හේතුවෙන් දිස්ත්‍රික්කය තුළ ජීවිත හානි කිසිවක් සිදු නොවූ අතර බලපෑමට ලක්වූ පවුල් ප්‍රමාණය 470 ක් ද, පුද්ගලයින් 1673ක් ද, නිවාස පූර්ණ හානි 02ක් ද, නිවාස අර්ධ හානි 250ක් සහ ව්‍යපාරික හානි 32ක් ද, පොදු දේපල හානි 19 ක් වශයෙන් වාර්තා වූ බවත් දැනුම් දෙන ලදී. | ආයතන අතර සම්බන්ධීකරණ කටයුතු විධිමත්ව පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු සිදු කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>පළාත් පාලන කොමසාරිස්<br><br>සහකාර අධ්‍යක්ෂ ආපදා කළමනාකරණ<br><br>ආරක්ෂක අංශ<br><br>සහකාර පළාත් පාලන කොමසාරිස් |
| 06 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ අවධානය යොමු කළ යුතු ජල ගැලීම්වලින් යට වන ප්‍රදේශ | | | |
| 6.1 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් තවාලුවිල සහ තණලන්ද ප්‍රදේශය | මෙම ප්‍රදේශය පහත් බිම් ප්‍රදේශයක් වන බැවින් දීර්ඝ කාලීන විසදුමක් ලැබිය යුතු බව පෙන්වා දෙන ලදී. පළාත් වාරිමාර්ග අධිකාරිය මඟින් මේ වන විටත් වැඩ ආරම්භ කර ඇති මාර්ගය ප්‍රධාන මාර්ගය දක්වා දීර්ඝ කල හැකි වන්නේ නම් ස්ථිර විසඳුමක් ලබා ගත හැකි බව පෙන්වා දෙන ලදී. | අත්‍යවශ්‍ය ස්ථාන හදුනා ගෙන එම කොටස් සකස් කිරීම සඳහා වැය වන මුදල ඇස්තමේන්තු කර දන්වන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ඉංජිනේරු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>අදාළ ප්‍රාදේශීය ලේකම්වරු<br><br>නාගරික කොමසාරිස්<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස් හම්බන්තොට<br><br>සහකාර අධ්‍යක්ෂ (ආපදා)<br><br>දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු |
| 6.2 | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඩා වැල්ල ප්‍රදේශය | මෙම ප්‍රදේශයේ ගංවතුර ඇති වීම වැලැක්වීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත්, අදියර 03ක් යටතේ එම කටයුතු නිම කිරීමට බලා පොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදී.<br>මීට අමතරව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිරිජ්ජවිල වරාය ගම්මානය සහ මරේ පාර ප්‍රදේශයේ නිවාස ජලයෙන් යටවන ප්‍රදේශ ලෙස | | |



CS CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ප්‍රකාශ කරන ලදී. | | |
| 6.3 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කොග්ගල්ල ප්‍රදේශයේ පිහිටි කඩවර වැව පිටාර ගැලීමෙන් අවට කුඹුරු ඉඩම් ජලයෙන් යටවීම. | කඩවර වැව පිටාර ගැලීම නිසා කුඹුරු අක්කර 500 ක් පමණ ජලයෙන් යටවන බවත්, වැවේ සූරියවැව මායිමේ අනවසර අල්ලා ගැනීම් හේතුවෙන් කඩවර වැවට අයත් භූමි ප්‍රමාණය අඩුවීම නිසා වැවේ රදවා ගතහැකි ජල ධාරිතාව අඩුවීමත්, බස්නා ඇල පුළුල් කිරීමට නොහැකිවීමත් නිසා වැව පිටාර ගැලීම සිදු වන බැවින් මෙම ගැටලු දීර්ඝ කාලයක සිට පැවත එන බවත් දන්වන ලදී. මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව එක්ව සාකච්ඡාවක් සිදුකර මේ වන විට යෝජනා සකස් කරමින් පවතින බව දන්වන ලද අතර මහවැලියේ යන්ත්‍ර සූත්‍ර යොදා ගනිමින් හෝ අවශ්‍ය කටයුතු සිදු කිරීමට මහවැලි අධිකාරිය එකඟවන බව ප්‍රකාශ කරන ලදී. | වැවට අයත් ප්‍රදේශය නිශ්චිතව මැනුම් කර අනවසර ලෙස වගා කරන බිම් ප්‍රමාණය හදුනා ගන්නා ලෙසත් ඔවුන්හට වගා කිරීම සඳහා වෙනත් ඉඩම් පවතීදැයි සොයා බලන ලෙසත් ගැටළුව විසදීම සඳහා මහවැලි අධිකාරියෙන් ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. | නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br><br>පළාත් වාරිමාර්ග ඉංජිනේරු<br><br>වාරිමාර්ග ඉංජිනේරු හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 07 | දිස්ත්‍රික්කය තුළ ඇති අනතුරුදායක ගස් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික්කය තුළ අවදානම් සහිත ගස් 1171ක් පවතින අතර එය අධි අවදානම් ගස් 596ක් සහ අවදානම් සහිත ගස් 575ක් ලෙස හඳුනා ගෙන ඇති බව ප්‍රකාශ කරන ලදී.මෙම ගස් ඉවත් කිරීමේ ක්‍රියාවලිය දැව සංස්ථාව මගින් සිදු කරනු ලබන අතර ඔවුන් වෙත ගස් ඉවත් කිරීම සඳහා ලිපි ලැබෙන පිළිවෙල අනුව එම කටයුතු සිදු කරන අතර ටෙන්ඩර් ක්‍රියාවලියේ දී ඇතිවන ප්‍රමාදයන් මත ගස් ඉවත් කිරීමේ ප්‍රමාදයන් පවතින බව ප්‍රකාශ කරන ලදී. | දිස්ත්‍රික්කයේ ඇති අවදානම් සහිත ගස් ඉවත් කිරීමේ ක්‍රමවේදයක් කඩිනමින් සකස් කර මීලඟ සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු දැව සංස්ථාව හම්බන්තොට<br><br>ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය |
| 7.1 | කච්චිගල්ආර හන්දියේ ඇති බෝගස ඉවත් කිරීම සම්බන්ධව - | මෙම අනතුරු දායක බෝ ගස ඉවත් කිරීම සඳහා අඟුණුකොලපැලැස්ස ප්‍රාදේශීය සභාව මැදිහත් වී කටයුතු ආරම්භ කළ ද ඉතා විශාල බෝ ගසක් බැවින් එය ඉවත් කිරීමට සභාව සතු යන්ත්‍රෝපකරණ ප්‍රමාණවත් නොවන බැවින් බෝ ගස ඉවත් කිරීම සඳහා පිටස්තර පාර්ශවකරුවන්ගෙන් මිල ගණන් කැඳවන ලද බවත්, එසේ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවල දක්වා ඇති මිල රු.ලක්ෂයකට වැඩි බවත් පවතින ප්‍රතිපාදන සීමාව තුළ එය සිදු කිරීම ගැටළුවක් බවත් ප්‍රකාශ කරන ලදී.<br>තවද, බෝ ගස් සහ නුග ගස් ඉවත් කිරීම ගැටළුවක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී, මේ අතර වීරකැටිය කොට්ඨාසයේ වකමුල්ල බෝගස කඩා වැටුණ බවත් එය ඉවත් කිරීමට දැව සංස්ථාවට දැන්වූවත් ඔවුන් ඒ සඳහා නොපැමිණි බවටත් කරුණු ඉදිරිපත් වූ අතර දැවමය වටිනාකම් සහිත ගස් පමණක් තමන් ඉවත් කරන බව දැව සංස්ථාව දැනුම් | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුවන බැවින් එම බලය භාවිත කර අදාළ ප්‍රතිපාදන පළාත් සභාව මගින් ලබා ගෙන ගස් ඉවත් කිරීමේ කටයුතු සිදු කරන ලෙස උපදෙස් දෙන ලදී. | පළාත් පාලන සහකාර කොමසාරිස්<br><br>ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | දෙන ලදී. | | |
| 08 | ඔකෙවෙල මාවතගොඩ තාවකාලිකව ඉදිකර තිබූ පාලම කැඩීයාමෙන් ගමනාගමනයට බාධා ඇති වීම. | මේ වන විට ඔකෙවෙල මාවතගොඩ පාලම ඉදිකිරීම සඳහා රු.මිලියන 15 ක ඇස්තමේන්තුවක් සකස් කර ඇති බව දන්වන ලදී. වීරකැටිය ප්‍රාදේශීය සභාව මැදිහත්වී සිලින්ඩර් 03 ක් යොදා තාවකාලික පාලමක් ඉදිකරන ලද අතර පසුගිය දිනවල ඇදහැලුණු අධික වර්ෂාපතනයත් සමඟ ඇති වූ ජල ගැලීම හේතුවෙන් සිලින්ඩර් 03ක් යොදා ඉදිකර තිබූ පාලම ද කැඩී ගිය බවට අදහස් ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රදේශයට ලඟාවිය හැකි වෙනත් ගොඩබිම් මාර්ගයක් නොමැති බවත් එම ප්‍රදේශයේ පවුල් 17 ක පුද්ගලයින් 55 ක් ජීවත් වන බවත් ප්‍රකාශ කරන ලදී.<br>ස්ථිර පාලමක් සකස් කර දෙන තෙක් තාවකාලික පාලමක් සකස්කළ යුතු බැවින් හාවිතයෙන් ඉවත්කරනු ලබන විදුලි කනු ලබා ගැනීම සඳහා විදුලි බල හා බලශක්ති රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීම් කර ඇති බවත්, සිලින්ඩර් යෙදීම වෙනුවට ලයිට් කනු යොදා සකස් කිරීම ඵලදායී වන බවත් ප්‍රකාශ විය. | අදාළ ආයතන සම්බන්ධ කර ගනිමින් තාවකාලික පාලමක් කඩිනමින් සකස් කර දෙන ලෙස උපදෙස් ලබා දුන් අතර ස්ථිර පාලමක් සකස් කර ගැනීම සඳහා අමාත්‍යංශය වෙත දැන්වීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>ප්‍රාදේශීය ලේකම් ඔකෙවෙල<br>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු වීරකැටිය<br>දිස්ත්‍රික් ඉංජිනේරු හම්බන්තොට |
| 09 | හම්බන්තොට දිස්ත්‍රික්යේ ඉඩම් ගැටළු සම්බන්ධව | | | |
| 9.1 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ උරුමය වැඩසටහනට අදාළ ප්‍රගතිය ඉදිරිපත් කිරීම | මෙම වැඩසටහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරන ලද අතර ගැටළු නොමැති මැන අවසන් කර ඇති අවසර පත්‍ර 2451 ක් සහ ගැටළු නොමැති මැන අවසන් කර ඇති දීමනා පත්‍ර 3882ක් මෙම අදියර සඳහා යොදා ගතහැකි බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන විට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත භාර දී ඇති බලපත්‍ර සහ දීමනාපත්‍ර සංඛ්‍යාව 4295 ක් වන බවත්, 398 දකුණු පළාත් ඉඩම් කොමසාරිස්/අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමුකර ඇති බව ප්‍රකාශ කරන ලදී.<br>ග්‍රාම නිලධාරීවරුන් උරුමය වැඩසටහනින් ඉවත් වී ඇති බැවින් වැඩසටහන කඩිනමින් ඉටු කිරීමට බාධා ඇති බවද , වාර්තා ලබාගැනීමේ ගැටලු පවතින බවත්, පෙන්වා දෙන ලදී. මේ වන විට පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කරන ලද දීමනාපත්‍ර 398 නිර්දේශ කර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇති බව දන්වන ලදී | පළාත් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇති තිස්සමහාරාම, ලුණුගම්වෙහෙර, සූරියවැව, හම්බන්තොට, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ ඔප්පු ජංගම සේවයේදී ලබා දීමට අවධානය යොමු කරන බව ප්‍රකාශ කරන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br>පළාත් ඉඩම් කොමසාරිස්<br>ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 9.2 | කැකිරි ඔබඩ ජලාශය ඉදිකිරීමේදී අවතැන් වූවන් වෙනුවෙන් හම්බන්තොට | කැකිරිඔබඩ ජලාශය ඉදිකිරීමේදී එම භූමියෙන් ඉවත් කරන ලද වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පුද්ගලයින් පිරිසක් හම්බන්තොට | මෙම කාරණය සම්බන්ධයෙන් කමිටු අනුමැතිය ලබා දෙන ලද අතර, මෙම ගැටළු පිළිබඳ විස්තර ඇතුළත් ලිපියක් ඉඩම් | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ලබා දීම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුනාමි නිවාසවල පදිංචි කර ඇති බව ප්‍රකාශ කරන ලදී. මෙම නිවාසලාභීන්හට මේ වන විටත් කිසිදු ඔප්පුවක් ලැබී නොමැති බැවින් ඔවුන් දීමනාපත්‍රයක් ඉල්ලා සිටින බැවින් කැබිනට් පේපර් එකක් මඟින් ඉඩම් ආඥා පනත යටතේ නොමිලයේ දීමනාපත්‍රයක් ලබා දීමට එකඟතාවය ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද, මෙම පුද්ගලයින් කුරුඳු, ගම්මිරිස්,වගාවල යෙදෙන ස්ථිර ආදායම් මාර්ග තිබූ පුද්ගලයින් බවද දන්වන ලදී. | කොමසාරිස් වෙත යොමු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් වෙත දන්වන ලදී. | පළාත් ඉඩම් කොමසාරිස් |
| 9.3 | රිදියගම නිවර්තන නිවාසයේ ප්‍රයෝජනයට නොගන්නා ඉඩම් සම්බන්ධව | සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මෙම භූමියේ අනවසර මැණික් ගැරීම් සිදුවන බැවින් භූමියේ මැණුම් කටයුතු සිදු කර බිම් කොටස් වෙන්දේසියකින් පසු මැණික් ඉවත් කර ගැනීමෙන් අනතුරුව ඉදිරි සංවර්ධන කටයුතුවලට ගැලපෙන පරිදි යථාවත් කොට නැවත සමාජසේවා දෙපාර්තමේන්තුවට භාරදීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ඉල්ලීම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දැනුවත් වීම සඳහා ඉදිරිපත් කරන ලදී. | පළාත් සභාව මගින් පාලනය වන ගොවිපල තවදුරටත් පළාත් සභාව යටතේ තබා ගැනීමටත් ඉතිරි කොටස් මධ්‍ය රජයට පවරා ගනිමින් සංවර්ධන කටයුතු කිරීම සම්බන්ධයෙන් එකඟතාව ලබා දීමට තීරණය විය. | සභාපති ජාතික මැණික් හා සවර්ණාභරණ අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට<br><br>සමාජ සේවා අමාත්‍යංශය |
| 9.4 | වීරවිල හා බෙරලිහෙල නව නගර දෙකෙහි ඇති වාණිජ ඉඩම් හා පොදු කටයුතු සඳහා වෙන්කර ඇති ඉඩම් සම්බන්ධව | කිරිදි ඔය ජනාවාස යෝජනා ක්‍රමය ආරම්භයේදී 1983 වර්ෂයේ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සැලසුම් පරිදි වීරවිල නගරයේ සිනමා ශාලාව සඳහා වෙන්කර තිබූ ඉඩම මහජන පොල සඳහා භාවිත කරන ලද අතර බෙරලිහෙල සුසාන භූමිය සඳහා වෙන්කර ඇති ඉඩමද පොල සඳහා භාවිත කරන බවට කරුණු ඉදිරිපත් කරන ලදී. මේ වන විට මෙම ස්ථාන සම්පූර්ණයෙන්ම වල් බිහිවී ඇති බැවින් ඒ බව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම්දීමෙන් අනතුරුව අදාළ පාර්ෂව සමඟ සාකච්ඡාකර නව නගර සැලැස්ම යාවත්කාලීන කරන ලෙස දැනුම් දී ඇති බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව මෙම මස 28 වන දින සියලු පාර්ෂව එක්වී සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කර ඇති බව ප්‍රකාශ කරන ලදී.<br>ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි ලුණුගම්වෙහෙර ව්‍යාපාරය ආරම්භ කිරීමෙන් පසු පවරා ගන්නා ලද ඉඩම වීරවිල නව නගරයට අයත් අක්ක 300 | සියළු ආයතනවල සහභාගීත්වයෙන් මෙම මස 28 දින පැවැත්වීමට නියමිත සාකච්ඡාවේදී මේ පිළිබඳ සුදුසු තීරණයක් ගැනීමට තීරණය විය. | අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් දෙබරවැව<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>ප්‍රාදේශීය ලේකම් ලුණුගම්වෙහෙර |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ක් පමණ වන ඉඩමෙන් අක්කර 50ක පමණ භූමි ප්‍රදේශයක් කොළඹ විශ්ව විද්‍යාලයේ පඨක රෝපණ ඒකකයට ලබා දීම සහ බෙරලිහෙල නගරයේ ඇති ඉඩම් මිනිසුන් සඳහා බෙදා දෙන්නේද යන්න ගැටළු සහගත බවට අදහස් ඉදිරිපත් විය | | |
| 10 | හම්බන්තොට වරායට පැමිණෙන මගී නෞකා සඳහා පහසුකම් සැපයීම | වෙනත් කිසිඳු ගමනාන්තයක දක්නට නොමැති ආකර්ශනීය ස්ථාන රැසක් කෙටි කාලයකින් නැරඹීමට හැකි වීම නිසා මෙම වරාය කේන්ද්‍ර කර ගනිමින් සංචාරකයින් පැමිණීමේ වර්ධනයක් වී ඇති බව ප්‍රකාශ විය. 2030 වර්ෂයේදී මෙම වරාය හරහා සංචාරකයින් මිලියන 04 ක් ගෙන්වා ගැනීමේ අරමුණින් වැඩසටහන් සැලසුම් කර ඇති බවත්, එම ඉලක්ක සම්පූර්ණ කර ගැනීමේ අරමුණු ඇතිව පහසුකම් සැලසීම සැලසුම් කරන බවත් දැන්වීය. දැනට නැවකින් එක් ගමන් වාරයකදී සංචාරකයින් 2500 ක් පමණ පැමිණෙන අතර ඔවුන්ට එකවර ගේට්ටු අංක 02න් ඉවතට පැමිණීමේදී ගැටළු කිහිපයකට මුහුණදීමට සිදුවන බවත් දැනුම් දෙන ලදී. එනම් ප්‍රවාහන පහසුකම් ලබා දීමට ඉදිරිපත්වන පුද්ගලයින් අතර පවතින තරඟකාරී බව, වරායේ සිට ගේට්ටු අංක 02 දක්වා ඇතැම් සංචාරකයින්ට කි.මී 2.5 පමණ දුරක් පාගමනින් පැමිණීමට සිදු වීම.<br>සංචාරකයින් සඳහා නිවැරදි මඟ පෙන්වීමක් සිදු නොවීම.<br>එක් එක් ගමනාන්තයකට යන ප්‍රවාහන වියදම ප්‍රදර්ශනය නොකිරීම,<br>ගේට්ටු අංක 02 අසල සනීපාරක්ෂක පහසුකම් සහිත විවේකාගාරයක් **(waiting Area)** නොමැති වීම.<br>සංචාරකයින් සඳහා පහසුකම් සපයන වාහන සඳහා රථ ගාලක් නොමැති වීම.<br>මෙම ගැටළු අවම කර ගැනීම සඳහා රියදුරන් ලියාපදිංචි කිරීම, සංචාරක මඟපෙන්වන්නන් පුහුණු කිරීම වරායට පැමිණෙන සංචාරකයින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව සුරකෙන පරිදි පිළිගැනීම, වරායේ සිට ගේට්ටු අංක 2 දක්වා අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් සැපයීම, ප්‍රවාහන කුළී, ඓතිහාසික ස්ථාන ප්‍රදර්ශනය කිරීම වැනි කටයුතු සැලසුම් කර ඇති බවත්, මේ සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අදාළ පාර්ශවවල සහාය අවශ්‍ය බවත් | මෙය විදේශ විනිමය ලබා ගත හැකි වඩාත් සාර්ථක ක්‍රමයක් බැවින් රාජ්‍ය ආයතන එක්වී ඒකාබද්ධ සැලසුමක් යටතේ ක්‍රියා කරන ලෙසත්, දැනටමත් පිහිටුවා ඇති සංචාරක පොලීසියේ සහාය සෑම අවස්ථාවකම ලබා දෙන ලෙසත්, පහසුකම් සැපයීමේ ක්‍රමවේදය නිරන්තරව අධීක්ෂණය කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | අධ්‍යක්ෂ ජනරාල් සංචාරක අමාත්‍යාංශය<br><br>සභාපති රුහුණු සංචාරක කාර්යාංශය<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (පාලන)<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>ප්‍රධාන විධායක නිලධාරී හම්බන්තොට වරාය<br><br>ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල<br><br>සභාපති දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ප්‍රකාශ කරන ලදී. ලෙනාඩ්වුල්ෆ් බංගලාව, මාවෙලෝ කුළුණ, එල්ලුම්ගස, කෞතුකාගාරය සහ චමල් රාජපක්ෂ ආයුර්වේද රෝහල වැනි ස්ථාන ද සංචාරක ගමනාන්ත ලෙස නම් කළ හැකි බවත්, දකුණු පළාත් රුහුණු සංචාරක කාර්යාංශය මඟින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක විය හැකි බවත් දන්වන ලදී. | | |
| 11 | ලුණුගම්වෙහෙර ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක නොවීම | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා 4000 ක් පමණ ප්‍රමාණයක් ඉල්ලුම් කර ඇති අතර නිෂ්පාදනයේ වැඩිවීමක් නොවන බැවින් ඉන් තිස්සමහාරාමය සඳහා 500ක්ද ලුණුගම්වෙහෙර සඳහා 500 ක් ලෙස ජල සම්බන්ධතාවය ලබා දිය හැකි බැවින් ඒ සඳහා දිනයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | තිස්සමහාරාම සහ ලුණුගම්වෙහෙර ජල සැපයුම ලබා දීම සඳහා අමාත්‍යාංශයටද සහභාගීවන ලෙස දන්වා මෙම මස 24 සහ 25 යන දෙදින යොදා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය කළමනාකරු ජලසම්පාදන මණ්ඩලය |
| 12 | සාකච්ඡා කරනු ලැබූ වෙනත් කරුණු | | | |
| 12.1 | බෙලිඅත්ත දම්මුල්ල දේමැදිගොඩ ප්‍රදේශයේ පානීය ජල ගැටලුව සඳහා ස්ථිර විසදුමක් ලබා ගැනීම සම්බන්ධව - ගරු කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා | පවුල් විශාල ප්‍රමාණයක් සඳහා ළිං මාර්ගයෙන් ජලය ලබා ගන්නා අතර මේ වන විට එම ළිං වල ජලය ලවණ අධික වීම නිසා පරිභෝජනයට නුසුදුසු බවත් ඔවුන් නල ජලය ඉල්ලීම් කරන බවත් දැන්වීය. මෙම ප්‍රදේශය දැනට ජල සම්පාදන මණ්ඩලය මගින් ආවරණය නොකරන බවත් 500m ක් දුරින් ජාතික ජලසම්පාදන මණ්ඩලයේ ජල නල මාර්ගයක් පිහිටා ඇති අතර එම ජල නල මාර්ගය දීර්ඝ කිරීමෙන් හෝ බෙලිඅත්ත මිරිස්වත්ත දක්වා දිර්ඝ කිරීමට යෝජිත මාතර ජල නල ව්‍යාපෘතියේදී නල මාර්ගය දීර්ඝ කිරීම හෝ නවයාලවිල ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුවහොත් මෙම ගැටළුව විසදිය හැකි බව දන්වන ලදී. | මාතර දිස්ත්‍රික්කයත් සම්බන්ධ වන හෙයින් මෙ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට.<br><br>ප්‍රාදේශීය කළමණාකරු , ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| 12.2 | ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘති සම්බන්ධව පවතින ගැටළු | දිස්ත්‍රික්කය තුළ තොග ජල සැපයුම් ව්‍යාපෘති 06 ක් ඇති බවත් එම ජල ව්‍යාපෘති 6 ජල සම්පාදන මණ්ඩලයට පවරා ගන්නා ලෙසත් ගාස්තු ඉහළයාම හේතුවෙන් ජල ඒකකයක මිල ඉහළ යාම නිසා දැනට රු. ලක්ෂ 50 ක් පමණ ජලසම්පාදන මණ්ඩලයට හිග මුදල් ගෙවීමට තිබෙන බවත් දන්වන ලදි.<br>තවද ජලසම්පාදන මණ්ඩලයට ව්‍යාපෘති පවරා ගැනීමේදී ව්‍යාපෘතියෙන් කොටසක් වෙනුවට මුළු ව්‍යාපෘතියම පවරා ගන්නා ලෙස ඉල්ලා සිටින අතර දැනට පවතින හිඟ ජල බිල්පත් වාරික වශයෙන් ගෙවා අවසන් කල හැකි බවත් දන්වන ලදි.<br>පවතින ජල ගැටළුව විසඳීම සඳහා කිංචිගුණේ, අඟුණකොළ, කළමැටිය, අමරකුංගම හා පහලගම ජල ව්‍යාපෘති වැඩිදියුණු කල හැකි බව දන්වන ලදී. | එකම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන දෙකක් හෙයින් අමාත්‍යාංශ මට්ටමින් වෙනම මේ සම්බන්ධව සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය. | ප්‍රාදේශීය කළමණාකරු , ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br><br>ස්ථානභාර නිලධාරී, ප්‍රජා ජල සම්පාදන මණ්ඩලය. |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | සියළුම ජල බිල්පත් ගෙවා අවසන් වන තෙක් ප්‍රජා ජල ව්‍යාපෘති මණ්ඩලයට පවරා ගැනීම අසීරු බවත් පවරාගන්නා ජල ව්‍යාපෘති වල බට එලා ඇති ආකාරය , ප්‍රමිතිය යනාදිය පිළිබඳ ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් කල අතර සැපයීම සඳහා ජලසම්පාදන මණ්ඩලය සතුව ජලය තිබේ නම් පමණක් එකඟවිය හැකි බවත් දන්වන ලදී. | | |
| 12.3 | කුඹුරු ඉඩමක ගොඩවැලි කැණීම බලපත්‍රයක් ලබා දීම | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන් කාවකාලිකව නිර්දේශ ලබා දීම නවතා තිබූ අවස්ථාවක ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය නොමැතිව කුඹුරු ඉඩමක ගොඩවැලි කැණීමට අමාත්‍යාංශය මට්ටමින් භූවිද්‍යා හා පතල් කාර්යාංශය මඟින් බලපත්‍රයක් ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ප්‍රාදේශීය ලේකම් ගේ නිර්දේශ සහිත කමිටු නිර්දේශයෙ නොමැතිව බලපත්‍ර නිකුත් කිරීම නීති විරෝධී බවත් කමිටු නිර්දේශ නොමැතිව බලපත්‍ර නිකුත් නොකළ යුතු බවටත් දැන්වීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම්, අම්බලන්තොට,<br><br>කැනීම් ඉංජිනේරු, භූවිද්‍යා හා පතල් කාර්යාංශය. |
| 12.4 | කුඹුරු ඉඩම්වල කෙසෙල් වගා කිරීමට අවසර ලබා දීම | කුඹුරු යායේ කන්න රැස්වීම සඳහා මෙම කෙසෙල් වගා කරන ගොවීන් ඇතුළත් නොවන බවත් ලැබෙන ජලය කෙසෙල් වගාවට ප්‍රමාණවත් නොවීම, කෙසෙල් හා වී අස්වනු කුඹුරුවලින් ඉවත් කරගැනීමේදී ගැටළු මතුවීමත් සම්බන්ධයෙන් සාකච්ඡා වූ අතර කෙසෙල් වගාව සිදු කරන්නේ නම් ඊට අදාළ නිසි පියවරක් ගතයුතු බව ද සාකච්ඡා විය. | කුඹුරු ඉඩම් වල කෙසෙල් වගා කිරීම සඳහා කන්න රැස්වීම වලදී කෙසෙල් හා වී ගොවීන්ගෙන් සැදුම් ලත් කමිටුවක් මඟින් සාකච්ඡා කර තීරණ ගන්නා ලෙස ද උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 12.5 | ගොවිබිම වන සංරක්ෂණ සීමාවෙන් ඉවත් කර ගැනීම සම්බන්ධව | තිස්සමහරාම කාවන්තිස්සපුර 2006 වසරේ කෙතට අරුණ තිල් දියවර ව්‍යාපෘතිය යටතේ මාතකඩාර වැව ප්‍රතිසංස්කරණයෙන් පසු මේ වන විට අක්කර 200 ක් පමණ වැව ඉහළ සහ පහළ වගා කටයුතු සිදුකර වසර 25 ක් පමණ වන බවත් වර්තමානයේ වනසංරක්ෂණ සීමාවේ පැවතීම තුළ නිදහසේ වගා කටයුතු සිදුකරගෙන යාමට නොහැකි තත්ත්වයක් පවතින බවටත් කරුණු වාර්තා කර ඇති අතර වගා බිම් වනසංරක්ෂණ සීමාවෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලා ඇත. | වන සංරක්ෂණ සීමාව තුළ පවතින ගොවි බිම් මොනවාද යන්න පැහැදිලිව හඳුනා ගන්නා ලෙස දැනුම් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 12.6 | කාර්මික ජනපදයක් ස්ථාපිත කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට ඉඩමක් පවරා දීම | වීරකැටිය අග්‍රහැර පැරණි ගුවන් විදුලි සංස්ථාව පිහිටුවා තිබූ අක්කර 98 න් මේ වන විට අක්කර 20 ක භූමි ප්‍රමාණයෙන් මැණුම් කටයුතු අවසන් කර ඇති බිම් කොටසක් වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටින ලද අතර දැනටමත් කර්මාන්ත 10 කට වැඩි ප්‍රමාණයක් මෙම භූමියේ කර්මාන්ත කටයුතු ආරම්භ කිරීමට ඉදිරිපත් වී ඇති බවට කරුණු ඉදිරිපත් වන ලදී.<br>මේ වන වන විට කර්මාන්තපුර සඳහා සිටිනමළුව සූරියවැව සහ බටඅත ඉඩම් | ඉඩමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා දැනට කර්මාන්තපුර සඳහා ලබා දී ඇති ඉඩම්වල ආයෝජන කර ඇති ප්‍රමාණය හා ආයෝජනය කර නොමැති ප්‍රමාණය කමිටුවට වාර්තා කරන ලෙස දන්වන ලදී. | සහකාර අධ්‍යක්ෂ, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට/ සූරියවැව/ බෙලිඅත්ත |



CamScanner

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කොටස් පවරා දී අතර එම ඉඩම් වල ආයෝජනයන් දැකිය නොහැකි බවත් පවරා දී ඇති ඉඩම්වල සිදු කර ඇති ආයෝජනයන් සම්බන්ධයෙන් සොයා බැලිය යුතු බවටත් අදහස් ඉදිරිපත් විය . | | |
| 12.7 | භික්ෂු වාට්ටුවක් වෙන් කර ගැනීම සම්බන්ධව - බැරගම ප්‍රිය භාරත හිමි, විල්ගම් රජමහා විහාරය | දිස්ත්‍රික්කයේ වෙනත් රෝහල් වල භික්ෂු වාට්ටු ඇතත් හම්බන්තොට මහ රෝහලේ එවැනි වාට්ටුවක් නොමැති වීමෙන් ප්‍රතිකාර සඳහා රෝහලට පැමිණෙන භික්ෂු / භික්ෂුණීන් වහන්සේලා අපහසුතාවයට පත්වන බවටත් කරුණු ඉදිරිපත් විය. | අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>රෝහල් අධ්‍යක්ෂ, මහරෝහල, හම්බන්තොට |
| 12.8 | වැලිගත්ත මහා විද්‍යාලය හා කුඩා ගම්මාන 10 ප්‍රා.විද්‍යාලය ඒකාබද්ධ කිරීම | මෙම විද්‍යාල දෙක ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවයක් පැවතියත් වැලිගත්ත මහවිද්‍යාලය සඳහා පැමිණීමට කුඩා ගම්මාන 10 සිසුන් අකමැති වීම මත මෙම ගැටළුව නිර්මාණය වී තිබෙන බවත් කුඩා ගම්මාන 10 පාසලේ පහසුකම් වැඩිදියුණු කරන ලෙසත් ඉල්ලීම් ලැබී ඇති බව දැනුම් දෙන ලදි. තවද 2025 වසරේදී ගොඩනැගිල්ලක් ලබා දිය හැකි බවත් දැනුම් දෙන ලදි. | 2025 වර්ෂයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමෙන් අනතුරුව මේ සඳහා අනුමැතිය ලබා දිය හැකි බව දැනුම් දෙන ලදි. | ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ , හම්බන්තොට |
| 12.9 | මාමඩල විද්‍යාලය ඉදිරිපිට මගී ආවරණ ඉදිකිරීමට අනුමැතිය නොලැබීම. | මගී ආවරණය ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්වී ඇතැත් මේ දක්වා ඉදිකිරීම් සිදුව නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | ජූලි මස 13 වන දින සංවිධානය කර ඇති ජංගම සේවයේදී විවෘත කිරීම සඳහා මගී ආවරණ දෙක ඉදිකරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව අම්බලන්තොට |
| 12.10 | මැටි කර්මාන්තකරුවන් සඳහා මැටි ලබා ගැනීම | කැලියපුර මැටි කර්මාන්ත කරුවන්ගේ සාමාජිකයන් 54 ක් සිටින බවත් මැටි කර්මාන්තය සඳහා මැටි ලබා ගැනීමෙන් අනතුරුව මැටි ලබා ගන්නා ලද ස්ථානවල වලවල් වලට පස් පුරවා පැලසිටවීමෙන් පසු ඊලග පියවර ලෙස මැටි ලබා ගැනීම සඳහා අවසරය ලබාදීමට වනජීවී දෙපාර්තමේන්තුව විසින් තීරණය කර ඇති බවත් දැනුම් දුන් අතර එම කටයුතු සිදු කිරීම සඳහා කර්මාන්ත කරුවන් සඳහා ආර්ථිකමය ශක්තියක් නොමැති බවත් දන්වන ලදි.<br>තවද මහනගර සීමාවට අයත් කොටසක මෙම මැටි ලබා ගැනීම සිදුවන බවටත් කරුණු වාර්තා විය. | දැනට මැටි ගන්නා ලද වලවල් වසා දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බවත් ඉදිරියේදී මැටි ලබා ගැනීමේදී වලවල් පිරවීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම්, හම්බන්තොට<br><br>නාගරික කොමසාරිස්, හම්බන්තොට |



CamScanner

| 13 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති ලිපි | |
|---|---|---|
| i | මාර්ග කි.මී. 1500 සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | මාර්ග සංවර්ධන අධිකාරිය පැමිණ නැත. ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට ඇත. |
| ii | මාර්ග මාධ්‍ය ඉවත් කර පිවිසුමක් ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව | මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගන්නා ලෙස දැනුම් දෙන ලදී. |
| iii | උපමාන පාදක සංවර්ධන ප්‍රධාන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම 2024 – | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. |
| iv | 2024 වර්ෂයේ සුළු වාරිමාර්ග යෝජනා | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. |
| v | ලුණුගම්වෙහෙර පඩව්ගම ග්‍රාම නිලධාරී වසමේ ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ ඉදිකිරීම් නතර වී ඇති ග්‍රාම ශක්ති නිවාස ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කිරීම | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු12. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

එච්.පී සුමනසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

එච්. පී. සුමනසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2024 ජුනි මස ...20..................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CamScanner